## මගෙන් වචනයක්..

සමහර යාලුවො කියනවා නේ ජීවිතෙ දිනන්න විභාග පාස් වෙන්නම ඔනි නැ කියල.මෝටිවීශන් අයියල අප්පච්චිලා එම.හරි ඇති.

ඉතින් විභාග ෆෙල් වුන හැම මිනිහම ජීවිතෙ දිනුවද බං ? ඔයා හිතනවද ඔයාගෙ අනික් යාලුවො පාස් කියල කියද්දි ඔයා ෆෙල් කියල හරි ඔයා අඩු සාමාර්ථ අරන් තියෙද්දි හරි ඔයාට දැනෙන හැගීම ලස්සන එකක් වෙයි කියල..ඔයාගෙ අම්මට අප්පච්චිට දැනෙන හැගිම ලස්සන එකක් වෙයි කියල.

එක එකාගෙ වැල් බයිලා වලට යට වෙන්-නැතුව ඔයාගෙ ජීවිතේ අඩියක් හරි ඉස්සරහට එන්න හොදට විභාගේ ගොඩ දාගන්න.ජයග්‍රහණය නෙමෙ සහභාගි වීම වැදගත් කියන තර්කෙට වැඩ කරන්නෙ-පා.සහභාගි වෙලා ෆෙල් ලකුනක් අරන් වැඩක් නැ.හැමෝම හිනාවෙයි.ඉතින් සහභාගි වෙලා ජයග්‍රහණය අරන් පෙන්නන්න.අඩුම උත්සහා කරන්න.

ඔයාට ජයෙන් ජය පොඩ්ඩො.!!

Design by - Creativepixel.lk - Search us on fb/insta

Advanced level 2023

# මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම තිතටම මීඩියා



දොළොස්වැනි පාඩම

# සන්නිවේදන සමීක්ෂණ

Communication surveys

විස්තරාත්මක කෙටිසටහන් පොත

Advanced level 2023

මීඩියා

COMMUNICATION & MEDIA STUDIES

මොළේටම තිතටම මීඩියා

විස්තරාත්මක කෙටිසටහන් පොත

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ඉගිල්ලෙන්න තටු සුදානම් කරන පුංචි කුරුලු පැටව්න්ට ආදරෙන්

ලහිරු කේ. මදුශාන්

HNDIT , mass communication (UG)

076 3950730

071 0538308

## සමීක්ෂණ අර්ථකථනය - නිර්වචන

සමික්ෂණය යන්න පිළිබඳව **ඔක්ස්ෆර්ඩ් ශිෂ්‍ය ශබ්දකොෂයහි** සඳහන් කරන්නේ සාමාන්‍ය ජනතාවගේ අදහස් හා හැසිරීම් පිළිබද විමර්ශනය කිරිම යනුවෙනි.

**මලලසේකර ශබ්ද කෝෂයේ** දක්වන්නේ සොදිසි කරනවා යන්නයි.

සමික්ෂණය යනු තෝරාගත් නිශ්චිත භූමි කලාපයක වාසය කරන මිනිසුන්ගෙන් තොරතුරු රැස් කිරීමට යොදා ගන්නා ක්‍රමවේදයකි.

ප්‍රජාවක ක්‍රියාකාරකම් හා ඒවා නිර්මාණය වී ඇති ආකාරය පිළිබඳව සමාජ විද්‍යාත්මක ආකල්ප ඔස්සේ විමසා බැලීම දී යොදා ගන්නා ප්‍රමාණාත්මක දත්ත එකතු කිරීමේ ක්‍රියාවලියයි – **මර්ක් ඒබ්‍රහම්**

සමාජ තත්වයක් හො සමාජ ප්‍රශනයක් ක්‍රමවත්වව හා විධිමත්ව විග්‍රහ කිරිමයි – **හර්මන් එන් මොර්ස්**

ගැටලුවක් හෝ සංසිද්ධියක් පිළිබඳව විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ සොයා බැලීම සඳහා සිදු කරන පර්යේෂණ ක්‍රියාවලියක දී ඊට අදාළ දත්ත දායකයාගෙන් සෘජුවම තොරතුරු එකරාශී කර ගැනිම සඳහා භාවිත කරන උපාය මාර්ගයක් ලෙස ද **සමික්ෂණය හදුනා ගත හැකිය**

සමික්ෂණය මගින් පුද්ගලයයන්ගේ පෞද්ගලික තොරතුරු අදහස් මතවාද යෝජනා ක්‍රියාකාරකම් හැසිරීම් ආකල්ප ආදිය පිළිබද තොරතුරු(දත්ත) ලබා ගත හැකිය.

සමික්ෂණ ක්‍රියාවලියක දී ප්‍රාථමික දත්ත එක්රැස් කර ගනියි.

ගැටලුවක් පිළිබඳව විද්‍යාත්මක ක්‍රමයක් ඔස්සේ දත්ත ( තොරතුරු) එක් රැස් කර ගනු ලබයි.

**සමීක්ෂණ විධික්‍රම**
ප්‍රශ්නාවලි
සම්මුඛ සාකච්ඡා

**මෙවලම්**
තැපැල හා විද්‍යුත් නැපැල
අන්තර්ජාලය
දුරකථනය

**සමීක්ෂණ ක්‍රම (වර්ග)**
විස්තරාත්මක සමීක්ෂණ
විග්‍රහාත්මක සමීක්ෂණ

### විස්තරාත්මක සමික්ෂණ

කිසියම් ගැටලුක් පිළිබඳව විවිධ මානවලින් තොරතුරු එකරාශි කිරිම මෙහිදී සිදු කරයි. නිදසුනක් ලෙස රූපවාහිනී නාලිකාවක කිසියම් කාලසීමාවක් තුළ ප්‍රචාරය වන වෙළඳ දැන්වීම් ප්‍රමාණය, ඒවායේ වර්ගය, තත්ත්වය, ප්‍රචාරය වූ කාලය, පිළිබඳව මේ හරහා තොරතුරු ලබා ගත හැකිය.

මාධ්‍ය ක්ෂේත්‍රයේ දී සම්කාලින මාධා හැසිරීම, මාධ්‍ය ආයතන, වැඩසටහන් සහ වෙනත් මාධ්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධ විස්තරාත්මක සමික්ෂණ සිදු කළ හැකිය.

එමෙන්ම ගමක ඇති රූපවාහිනි යන්ත්‍ර ප්‍රමාණය, රූපවාහිනි නරඹන පුද්ගලයන්ගේ ප්‍රමාණය, වැඩියෙන්ම නරඹන රූපවාගිනි නාලිකාව, ශ්‍රවණය කරනු ලබන ගුවන්විදුලි නාලිකාව යන ආදි විස්තර සොයා ගැනිමට මෙම සමික්ෂණ ක්‍රමය භාවිතා කරයි.

විස්තරාත්මක සමික්ෂණයකින් ලබා ගන්නා දත්ත මගින් සිද්ධිය හෙ බලපෑම පිළිබඳව ගැඹුරු අවධානයක් යොමු නො කෙරේ.

නිදසුනක් ලෙස සියදිවි නසා ගැනිම පිළිබඳව මාධ්‍ය වාර්තාකරණය වැනි පර්යේෂණයක දී යම් කාල සීමාවක් තුළ වාර්තා පළ වී ඇති ප්‍රවෘත්ති ප්‍රමාණයණී එකම තොරතුර විවිධ මාධ්‍ය තුළ වාර්තා වී ඇති ආකාරය වැනි තොරතුරු පිළිබඳ අධ්‍යයනයක් මෙම සමි-ක්ෂණ ක්‍රමය හරහා සිදු කළ හැකිය. එමෙන්ම මේ හරහා යම් පුද්ගලයෙක්, ආයතනයක්, සිදුවිමක් පිළිබඳ තොරතුරු එකරාශි කළ හැකිය.

ගුණාත්මක හා ප්‍රමාණාත්මක කොරතුරු මෙමගින් එක්රැස් කර ගනියි.

විස්තරාත්මක සමික්ෂණය තුළින් කිසියම් ප්‍රවනතාවයක ව්‍යාප්තිය, සංයුතිය, ප්‍රමාණය ආදිය පිළිබඳව සොයා බලනු ලැබේ.

### විග්‍රහාත්මක සමික්ෂණ

සන්නිවේදනය හා මාධ්‍ය ක්ෂේත්‍රයේ දි විග්‍රහාත්මක සමික්ෂණයක් මගින් සිදු කෙරෙන්නේ කිසියම් ගැටලුවක් හො අවස්ථාවක් හො වැඩසටහනක් හෝ පිළිබඳව විද්‍යාත්මක ප්‍රවේශයකින් සොයා ගනු ලබන දත්ත අදාළ සමික්ෂණයේ අරමුණුවලට යටත්ව විග්‍රහාත්මකව විමසා බැලිමයි. එමෙන්ම මෙමගින් ඇතැම් තත්වය-න් පවතින්නේ මන්ද යන්න විස්තර කිරිමට සහ පැහැදිළි කිරිමට උත්සහ ගනු ලබයි. එමෙන්ම උපකල්පන පරික්ෂා කිරිම සඳහා විචල්‍යන් දෙකක් හෝ ඊට වැඩි ගණනක් පරික්ෂා කරනු ලැබේ.

මෙහිදී කිසියම් ගැටලුවක්, අවස්ථාවක්, වැඩසටහනක් පිළිබඳව විද්‍යාත්මකව ලබා ගන්නා දත්ත විශ්ලේෂණය කරයි. එමෙන්ම කිසියම් ගැටලුවකට අදාල වන හේතු එතුළින් වන බලපෑම මෙහිදී විග්‍රහ කරනු ලැබේ.
උදා: අන්තර්ජාලය හරහා පුද්ගලයන්ගේ ප්‍රචණ්ඩත්වය වර්ධනය වේද? වෙළඳ දැන්වීම් ප්‍රචාරය කිරීමෙන් පුද්ගලයන් තුළ භාණ්ඩ මිලදී ගැනීමට වැඩි නැඹුරුතාවයක් ඇතිවේද? භාවිතය නිසා පුද්ගලයන්ගේ සමාජ සම්බන්ධතා බිඳ වැටේද? වෙළඳ ප්‍රචාරණ දැන්වීමක් විසින් භාණ්ඩයක් මිල දී ගැනීම කෙරෙහි ග්‍රාහකයා වෙත කරනු ලබන බලපෑම කෙබඳු ද?

## සමීක්ෂණ භාවිතයේ වාසි

- කෙටි කාලයක් තුල ප්‍රශ්නාවලි සඳහා දත්ත රැස් කර ගැනීමේ හැකියාව ඇති බැවින් අඩු වියදමක් දැරීමට සිදු වේ.
- දුරකතනය, අන්තර්ජාලය, තැපැල වැනි ක්‍රම භාවිතා කරමින් ග්‍රාහකයා වෙත ළඟා වීමේ පහසුව.
- දත්ත දායකයන් විශාල ප්‍රමාණයකින් වුව ද තොරතුරු රැස් කිරීමේ හැකියාව.
- නිවැරදි ප්‍රමිතියට අනුව සමීක්ෂණය සිදු කිරීමෙන් දෝෂ අවම කරගත හැකිවීම.
- ආකල්ප, මතවාද, විශ්වාස, චර්යා රටා, සිදුවීම් හා වටිනාකම් යනාදිය පිළිබඳ පුළුල් පරාසයක පවත්නා තොරතුරු එක වර රැස් කර ගැනීමෙ හැකියාව
- සමීක්ෂණ භාවිතයේ අවාසි නිවැරදි සත්‍ය තොරතුරු ලබාදීමට දත්ත දායකයින් උනන්දු නොවීම
- තොරතුරු ලබාගැනීමේ දී අපක්ෂපාත බව ආරක්ෂා කර ගැනීමට දත්ත දායකයා අපොහොසත් වීම
- ඇතැම් ප්‍රශ්න සඳහා පිළිතුරු ලබා දීමේදී මතකය අඩුකම හො නොමැතිකම නිසා අසත්‍ය තොරතුරු ලැබීම.
- සංකීර්ණ ගැටළු සම්බන්ධයෙන පුද්ගල චර්යා, අදහස් හා ආකල්ප පිළිබඳ මිනුම් කළ නොහැකි වීම.
- ප්‍රශ්නාවලියක් මගින් දත්ත රැස්කරන විට ඒ සඳහා විස්තරාත්මක තොරතුරු ලබාදිය නොහැකි වීම

## 12.2 සමීක්ෂණ ක්‍රියාවලියේ පියවර

සමීක්ෂණ ක්‍රියාවලියෙ පියවර
1 ගැටලුව හඳුනාගැනීම
2 අරමුණු හඳුනාගැනීම
3 මාතෘකාව තීරණය කිරීම
4 දත්ත රැස් කිරීම
5 දත්ත විශ්ලේෂණය කිරීම
6 නිගමන
7 වාර්තාව ලිවීම

## සන්නිවේදන ක්ෂේත්‍රයේ දී ගැටලු හඳුනා ගත හැකි අවස්ථා

සමාජ මාධ්‍ය භාවිතය
මුද්‍රිත මාධ්‍ය භාවිතය
ජංගම දුරකථන භාවිතය
ගුවන් විදුලි මාධ්‍ය සවන් දීම
ජංගම දුරකතන භාවිතය
දත්ත රැස් කිරීම

## ප්‍රමාණාත්මක දත්ත

පර්යේෂකයා විසින් ලබා ගන්නා සංඛ්‍යාත්මක දත්ත මේ යටතට ගත හැකිය. උදා:
ශ්‍රී ලංකාවේ රූපවාහිනී නරඹන ප්‍රේක්ෂකයන් ප්‍රමාණය,
රූපවාහිනියෙන් සතියකට විකාශය වන ටෙලිනාට්‍ය ප්‍රමාණය,
ශ්‍රී ලංකාවේ අන්තර්ජාලය පරිශීලනය කරන පරිශීලකයන්ගේ ප්‍රමාණය.

මෙය තවදුරටත් පැහැදිළි කළ හොත් සංඛ්‍යා මගින් තහවුරු කළ හැකි සමාජ සබඳතා සහ මානව චර්යාවන් පිළිබඳ පර්යේෂණ මෙම ගණයට අයත් වේ. විශේෂයෙන්ම සමාජ මිනුම් මේ සඳහා භාවිත වේ. කිසියම් කර්මාන්ත ශාලාවක සේවක සංඛාව, නිෂ්පාදනය වියදම ආදී දෑ පිළිබඳ නිවැරදි සංඛ්‍යාත්මක දත්ත ඉදිරිපත් කළ හැක. එසේම සමාජයේ අපරාධ, දූෂණ වැනි සිදුවීම් මෙන්ම වෙනත් කරුණු පිළිබඳව ද සංඛ්‍යාත්මක කරුණු ඉදිරිපත් කිරීම සිදු කළ හැකිය.

නිදසුනක් ලෙස
ආයතනයක් යම් කාලසීමාවක් තුළ වෙළඳ පොළට හඳුන්වා දෙන ලද භාණ්ඩ ප්‍රමාණය.
යම්කාල සීමාවක් තුළ අලෙවි නොවූ භාණ්ඩ ප්‍රමාණය. දැක්විය හැකිය.

## ගුණාත්මක දත්ත

යම් දෙයක ගුණාංග, එයට ආවේනික වූ ලක්ෂණ මෙමගින් පෙ-න්වා දෙනු ලබයි. උදා: මෙගා ටෙලිනාටය වල පවතින සුවිශේෂී ලක්ෂණනී ගුවන්විදුලි නාට්‍යවල සුවිශේෂී ලක්ෂණ.

එමෙන්ම ගුණාත්මක පර්යේෂණ සංඛායාත්මකව ඔප්පු කළ නොහැකිය. වැඩි වශයෙන් මානව විද්‍යා අධ්‍යයන අංශවල මෙබඳු පර්යේෂණ දක්නට ලැබේ. යම් සිදු වීමක චර්යාත්මක ස්වරූපය වඩාත් ගැඹුරින් හැදැරිය හැකි වන්නේ ගුණාත්මක පර්යේෂණ පර්යේෂණ තුළිනි. එහිදී මිනිසුන් පුද්ගලික ලෙස හෝ සාමුහික වශයෙන් ගෙන ඔවුන්ගේ විවිධ ගුණ එකතු කොට විග්‍රහ කළ හැකිය. නිදසුනක් වශයෙන් මිනිසුන් හැසිරෙන්නේ කෙසේ ද? ඔවුන්ගේ විශ්වාස ඇදහිලි ආකල්ප රටාවන් ගොඩ නැගී ඇත්තනේ කෙසේ ද? ඔවුන් එකෙනෙකා අතරේ පවතින පවුල් සම්බන්ධතාවයේ ස්වරූපය කෙසේද? යන ගැටලු සඳහා විසඳුම් ලබා ගත හැකි වන්නේ ගුණාත්මක පර්යේෂණ ක්‍රමය තුළිනි.

පර්යේෂණයක දි පර්යේෂකයා සොයා ගන්නා තොරතුරු ( දත්ත) කොටස් දෙකක් යටතේ වර්ගිකරණය කළ හැකිය.

ප්‍රාථමික දත්ත
ද්විතික දත්ත

## ප්‍රාථමික දත්ත

සම්ක්ෂකයා විසින්ම සොයා ගන්නා දත්ත මේ නමන් හැඳින් වේ. නිදසුනක් ලෙස සම්ක්ෂකයා සම්මුඛ සාකච්ජා මගින්, ප්‍රශ්නාවලියක් දත්තදායකයන්ට ලබා දිම තුළින් රැස් කර ගන්නා දත්ත මෙයට අයත් වේ.

## ද්විතීක දත්ත

සම්ක්ෂකයා විසින් පොතපත කියවිමෙන්, විවිධ ලේඛන පරික්ෂා කිරිමෙන්, විවිධ පර්යේෂණ ග්‍රන්ථ පරිශිලනය කිරිමෙන් සොයා ගන්නා දත්ත මේ නමින් හදුන්වනු ලැබේ.

දත්ත රැස්කිරීමට යොදාගන්නා ප්‍රධාන ක්‍රමවේද
ප්‍රශ්නාවලි
සම්මුඛ සාකච්ජා

## ප්‍රශ්නාවලි සකස් කිරීමේදී වැළකී සිටිය යුතු කරුණු

-පක්ෂපාත පිළිතුරු අපේක්ෂාවෙන් ප්‍රශ්න ඇසීම
-දීර්ඝ ප්‍රශ්න ඇසීම
-අනුමාන ප්‍රශ්න ඇසීම
-ව්‍යාකුල ප්‍රශ්න ඇසීම
-දත්ත දායකයන් අපහසුතාවයට පත්වන ප්‍රශ්න ඇසීම
-එකම ප්‍රශ්නය නැවත නැවත ඇසීම

නියැදිය

සමීක්ෂකයෙකුට සමස්ත ජනගහණයම සමීක්ෂණය කළ නොහැකි විට සමස්තය නියොජනය වන පරිදි තෝරාගන්නා කොටස නියැදිය වේ.

නියැදිය තෝරා ගැනීමේ දී අපක්ෂපාතිභාවය ආරක්ෂා කර ගත යුතු ය.

නියැදිය තොරා ගැනීමේදී විවිධ ක්‍රම පවතින අතරණී ගැටලුවේ ස්වභාවය අනුව අදාළ නියැදි වර්ගය තෝරා ගැනීම කළ යුතුය.

උදා: අහඹු නියැදි ක්‍රමය
අහඹු ස්ථාවර නියැදිය

## දත්ත විශ්ලේෂණය සඳහා යොදාගන්නා ක්‍රම

**ප්‍රතිශත** – සමස්ත ප්‍රමාණයෙන් කිසියම් උප ඛණ්ඩයකි. ප්‍රතිශත දැක්විමට % සංකේතය යොදා ගනියි.

**වගු** – සමීක්ෂණය මගින් එකතු කර ගත් දත්ත පිළිවෙළකට සකසයි.

**මාතය** – සමීක්ෂණ ක්‍රියාවලියේදී යම් සිදුවීමක වැඩිම වාර ගණනක් පෙන්නුම් කරනු ලබන අගය යි.

**මධ්‍යස්ථය** – සංඛ්‍යා ව්‍යාප්තියක් ආරොහණණී අවරෝහණ පිළි-වෙලට ලියා සමාන කොටස් 2 කට බෙදු විට හමුවන මධ්‍ය ලක්ෂ්‍ය අගය යි.

**මධ්‍යනය** – සියලු දත්ත එකතු කර වාර සංඛ්‍යාවෙන් බෙදු විට ලැබෙන අගය යි.

**ප්‍රස්තාර** – දත්ත පිළිබඳ රූපීය ප්‍රකාශනයකි.

**අනුපාතය** – සංඛ්‍යා දෙකක සහසම්බන්ධතාව අනුපාත මගින් ප්‍රකාශ කෙරේ.

## වාර්තාවේ මූලිකාංග

හැඳින්වීම
ක්‍රමවේදය
දත්ත විශ්ලේෂණය
නිගමන
මූලාශ්‍රය
උපග්‍රන්ථය
වාර්තාව ඉදිරිපත් කිරිම.

## සමීක්ෂණ ක්‍රියාවලියේදී පිළිපැදිය යුතු ආචාරධර්ම

සමීක්ෂණයේදී ගුණාත්මක භාවය හා ප්‍රමිතිය ආරක්ෂා කර ගැනීම
නිවැරදි සමීක්ෂණ ක්‍රමවේද භාවිතය
දත්ත හිතාමතා විකෘති නොකිරීම
වැරදි දත්ත ඇතුළත් නොකිරීම.
දත්ත දායකයාගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම
බුද්ධිමය දේපල අයුතු ලෙස භාවිතා නොකිරීම
පවත්නා නෛතික සීමාවන් ට යටත් ව ක්‍රියා කිරීම
දත්ත දායකයාට නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය